ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

# පුවත්පත් නිවේදනය

## ITEC දින සැමරුමේදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අධ්‍යාපන සහ කුසලතා පුහුණු ක්ෂේත්‍රයේ සහයෝගීතාවයට කැප වේ

ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතා (ITEC) වැඩසටහන හරහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ධාරිතා ගොඩනැගීමේ හවුල්කාරිත්වයේ 60 වසරක් සපිරීම සනිටුහන් කරමින් කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාල විසින් 2025 පෙබරවාරි 5 වන දින ITEC දිනය සමරන ලදී.

2. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා සහ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක නියෝජ්‍ය අමාත්‍ය අරුන් හේමචන්ද්‍ර මැතිතුමා මෙම අවස්ථාවට සහභාගී වූහ. එසේම, ශ්‍රී ලංකාවේ ITEC ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්, විවිධ ITEC වැඩසටහන් යටතේ ඉන්දියාවේ පැවැත්වූ විවිධ පාඨමාලාවන්ගෙන් ප්‍රතිලාභ ලබා ගත් විවිධ ක්ෂේත්‍රවල නිලධාරීන් සහ වෘත්තිකයන් 200කට අධික පිරිසක් මෙම උත්සවය සඳහා සහභාගී වූහ.

3. මෙම අවස්ථාව අමතමින් නියෝජ්‍ය අමාත්‍ය අරුන් හේමචන්ද්‍ර මැතිතුමා ITEC වැඩසටහන දැනුම හුවමාරුව සඳහා මාහැඟි වේදිකාවක් පමණක් නොව දෙරට අතර ශක්තිමත් ඓතිහාසික, සංස්කෘතික සහ ආර්ථික සබඳතා ප්‍රවර්ධනය කරන පාලමක් බව සඳහන් කළේය. සහකාර රටවල් සඳහා ධාරිතා ගොඩනැගීම, දැනුම බෙදා හදා ගැනීම සහ කුසලතා සංවර්ධනය අරමුණු කරගත් ITEC වැඩසටහන හරහා ජාත්‍යන්තර සහයෝගයට ඉන්දියාව දක්වන කැපවීම සම්බන්ධයෙන් නියෝජ්‍ය අමාත්‍යතුමා සිය ප්‍රශංසාව පළ කළේය. ශ්‍රී ලංකාවේ වෘත්තිකයන්

සවිබල ගැන්වීම සහ රාජ්‍ය සේවාවේ හැකියාවන් ඉහළ නැංවීමෙහි ලා වැදගත් කාර්යභාරයක් ඉටු කරන ITEC වැඩසටහන හරහා ලබා දෙන සහය සම්බන්ධයෙන් එතුමා ඉන්දියාවට සිය හද පිරි කෘතවේදිත්වය පළ කළේය. ITEC ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රවීණත්වය ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කරමින් ගෝලීය සහයෝගීතාවය ඉහළ නංවන බව සඳහන් කළ එතුමා ඔවුන්ගේ දායකත්වයන් අගය කළේය.

4. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස්තුමා පසුගිය වසර රැස පුරාවට ශ්‍රී ලංකා නිලධාරීන් විසින් ITEC වැඩසටහන සම්බන්ධයෙන් දැක්වූ උනන්දුව අගය කළේය. එතුමා දෙරට අධ්‍යයන ආයතන අතර හවුල්කාරිත්වයන් හරහා උසස් අධ්‍යාපනය ඇතුළු ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට සහය වීම සඳහා ඉන්දියාවේ කැපවීම අවධාරණය කළේය. දැනට වාර්ෂිකව වෙන් කර තිබෙන ITEC අවස්ථාවන් 402ට අමතරව ශ්‍රී ලංකාවේ නිලධාරීන්1500කට ඉන්දියාවේ ජාතික යහපාලන මධ්‍යස්ථානයේ පුහුණුව ලැබීමට අවස්ථාව උදාවන බව එතුමා සඳහන් කළේය. ‘වාසුධායිව කුටුම්භකම්’ (ලොවම එක් පවුලක්) යන දර්ශනය මත පදනම්ව ඉන්දියාව අඛණ්ඩව ශ්‍රී ලංකාව සඳහා ධාරිතා ගොඩනැගීමේ මූලපිරිම්හි ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරන බව එතුමා ප්‍රකාශ කළේය.

5. මෙහිදී වැඩසටහනේ පුළුල් සහ බහු විෂය ප්‍රවේශය ඉමහත් සේ අගය කරමින් ජ්‍යෙෂ්ඨ නිලධාරීහු ITEC පුහුණුවෙන් ලබා ගත් අත්දැකීම් බෙදා හදා ගත්හ. අන්තර්ග්‍රහණීය පාලනය, දේශගුණික විපර්යාස, පුනර්ජනනීය බලශක්තිය, ඩිජිටල් පරිවර්තනය, ආරම්භක සමාගම් පරිසර පද්ධතීන්, පාලනය තුළ කෘත්‍රිම බුද්ධිය, සයිබර් ආරක්ෂාව, තත්ත්ව පාලනය, කොන්ටම් කම්පියුටින් සහ තොරතුරු විද්‍යාව ඇතුළු පුළුල් පරාසයක පුහුණු ක්ෂේත්‍ර ITEC වැඩසටහන මගින් ආවරණය කරන බව පැවසූ ඔවුහු මෙම පුහුණු අවස්ථාවන් නව්‍යකරණය, ඉන්කියුබේෂන් සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කරන බව සඳහන් කළහ. මෙම වැඩසටහන සහභාගිවන්නන් වටිනා දැනුමෙන් සන්නද්ධ කරමින් ඔවුන්ගේ ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කරන බව ද එය ඔවුන්ගේ ක්ෂේත්‍රයේ ප්‍රගතිය

මෙහෙයෙවමින් ඵලදායි දායකත්වයක් ලබා දීමට ඉවහල් වන බව ද ඔවුහු පැවසූහ.

6. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා තාක්ෂණික සහයෝගය ලබා දීම සහ එම රටවල ධාරිතා සංවර්ධනය සඳහා 1964 වසරේ සැප්තැම්බර් මාසයේ ස්ථාපනය කරන ලද ITEC වැඩසටහන ඉන්දීය රජයේ ප්‍රමුඛතම වැඩසටහනකි. එය සහකාර රටවල මානව සම්පත් සංවර්ධනය සඳහා සහය ලබා දෙන වැදගත් මාධ්‍යයක් බවට පත්ව ඇති අතර රටවල් 160ක පුද්ගලයන් 200,000කට අධික සංඛ්‍යාවක් ITEC වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. ITEC වැඩසටහන යටතේ වාර්ෂිකව ශ්‍රී ලංකාවට අවස්ථා 500කට වැඩි ප්‍රමාණයක් ලබා දේ. ගෝලීය දකුණේ හවුල්කාරිත්වයේ සුවිශේෂී කුළුණක් වන මෙම වැඩසටහන සනිටුහන් කරමින් ලොව පුරා ඉන්දීය තානාපති කාර්යාල විසින් ITEC දිනය සමරනු ලබයි.

***

**කොළඹ**

**2025 පෙබරවාරි 07**